# සුලෙයිමානා අල්තානීය ගේ ළමාවියේ සුන්දර සටහන්

ඩබ් එස් නිලුක්ෂි වනසිංහ

ගිම්හාන නිවාඩුවට පාසල වැසීමට පෙරදා අපේ කොලු නඩය කඳුගැටයට වැදුනේ කුරුලුකූඩු විනාශ කිරීම සඳහාය.කෑකෝ ගසමින් උරුහන් බාමින් කඳුගැටයට නගින හැම වාරයකදී ම, යෝධ පොප්ලරයන් දෙදෙනා ඒ මේ අත වැනෙමින් සිය සිසිල් සෙවණින් හා කෝමල හඩ පතුරුවමින් අප සාදරයෙන් පිළිගන්නේ යැයි කියාපෑවාක් මෙන් මට දැනිණි. පාවහන් නැති මුරණ්ඩු කොල්ලන් වන අපි එකා පිට එකා නගිමින් ගස් බඩ ගාන්නෙමු. අතු රිකිලි ගානේ ඇදෙන අප කුරුල්ලන්ගේ රජය ආක්‍රමණය කරන්නේ වේගයෙනි. බියපත් වන කුරුළු රංචු අපට උඩින් කෑකෝ ගසමින් පියාඹති. කුරුල්ලන්ගේ කන්දොස්කිරියාව අපි ගණනකටවත් නොගත්තෙමු.
ලෝකයේ විශාලම ගොඩනැගිල්ල සමූහ ගොවිපලේ අස්සගාල බව අපගේ වැටහීම වුවද මෙතැන සිට බලන විට එය පෙනෙන්නේ කුඩා මඩුවක් මෙනි. ඇස් වලට පේන තෙක් දුර තිබෙන බොර නිල් පැහැති අහස දෙසත්, දසත පැතිර යන මහපොලොව දෙසත් බැලුවෙමු. ඉස්සර ගංගා නදී ඇතැයි සැක නොකල තැන්වල නොදුටු තැන්වල ගංගා ගලා බසින සැටි දුටුවෙමු. ඈත ක්ෂිතිජයේ රිදී කෙඳි සේ ගංගා නදී දිස් විය. අතුවල නිසලව ඉන්නා අපි මෙසේ සිතුවෙමු. මේ ලෝකයේ කෙළවරද, නැතිනම් තවත් ඈතට අහස විහිදී යන්නේද, එහි වළාකුළු තිබේද? අතු වල අප ඉන්නේ හුස්ම පවා නොගනිමිනි.සැඩ සුළංවල අපූරු හඬත් එයට මිතුරෙකු ලෙස පිළිතුරු දෙන තුරු ලතාවල කොළ ඈත රටවල අරුම පුදුම තොරතුරු ගැන කියන්නාක් මෙන් නගන හඬත් අපට ඇසිණි.
උණුසුම් සුළං කඳුකරය දක්වා පැතිර ගියේය. වසන්තයේ නැවුම් පුසුඹින් අවට ප්‍රබෝධමත් විය. කිරි දොවන විට නැගෙන හුමාලය මෙන් වසන්තය පැතිර ගියේය. කඳු මුදුන්වල හිම දියවෙන්නට පටන් ගත්තේය. හිම නිසා කැටි ගැසී තිබුණු ගංගා නදී ජලය කෙමෙන් දිය වෙමින් ගලා බසින්නට විය. පසුව මිටි තැන්සොයා ගිය ජලකද මහත් වෙමින් හඩ නගා ගලා බැස්සේය.
මගේ යෞවන සමයේ පළමු වැනි වසන්තය එය විය හැකිය. කොයි හැටි වුවද මේ වසන්තය පෙර ඒවාට වඩා සුන්දර බවක් ගෙන දුන්නේය. අපේ පාසල පිහිටි කඳුගැටය උඩ සිට බලන විට වසන්තය වැළැඳගත් ලෝකය අතිශයින්ම අලංකාර බවක් කියා පෑවේය. දෑත් විදහා ගත් වසන්තය කඳුකරයේ සිට පහළ බැස රිදී පැහැයෙන් දිළිසෙන ඉමක් කොනක් නැති ස්ටෙප්ස් බිම්වලට දුව ගියේ හිරු එළිය මුසු මීදුම් පටලයක් සහිතවය.හත් ගව්වක් දුර කොහෙදෝ විලක හිම දිය වී යන්ට පටන් ගත්තේය. හත් ගව්වක් දුර කොහෙදෝ තැනක අශ්වයෝ හේසාරවය කළහ. හත් ගව්වක් දුර අහසේ වටුවෝ සුදු පැහැති වළාකුළුසිය පියාපත් වලින් ගෙන පියඹා ගියෝය. පියඹා යන වටුවෝ විඩාපත් ගීතමය හඬකින් මිනිස් හදවතට ආයාචනා කළෝය. වසන්තය පැමිණීමත් සමඟම අපි වඩාත් ප්‍රීතියෙන් විසුවෙමු නොයෙකුත් විදියේ ළමා කෙළි සෙල්ලම්සොයා ගත් අපි තේරුම් රහිතව කොක් හඬලමින් සිනාසුනෙමු. පාසලේ වැඩ අවසාන වීමෙන් පසු ගෙවල් කරා දුව ගියේ කෑ කෝ ගසමිනි. මගේ හැසිරීම නිසා රොස්වූ නැන්දා මට බැණ වැදීමට අමතක නොකළාය.